# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1659/18 - 2010 ජුනි 23 වැනි බදාදා - 2010.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### සුරාබදු ආඥාපනත

අංක 916 දරන සුරාබදු නිවේදනය

මධ්‍යසාර සඳහා වූ සුරාබද්ද

*(රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණු කොට)*

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2010 ජුනි මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි—

(1) රා හෝ වෙනත් කිසියම් ධාන්‍ය වර්ගයකින් සෑදූ මත්පැන් හැරුණුකොට තාල වර්ගයේ ගසකින් හෝ වෙනත් ඕනෑම පැළෑටියකින් ලබාගන්නා ස්වභාවික නිෂ්පාදන ආසවනය කිරීමෙන් බැහැර ක්‍රියාවලියක් තුළින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ පරිමාවෙන් 4% ට වඩා මධ්‍යසාර අඩංගු වන සම්මත සැර මධ්‍යසාර සෑම ලීටරයකටම රුපියල් පන්සිය පහළොවක් (රු. 515.00) වන බද්දක් අය විය යුතු යැයි නියම කරමි. එසේ වී නමුදු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන යථෝක්ත මධ්‍යසාර කවර ප්‍රමාණයක් සම්බන්ධයෙන් වුව ද, එකී බද්ද අය නොකළ යුතු යැයි ද ;

(2) 2009 මාර්තු මස 26 වැනි දින අංක 1594/24 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 907 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

07-299/1

1A - G 13030— 1,330 (2010/06)

**සුරාබදු ආඥාපනත**

අංක 917 දරන සුරාබදු නිවේදනය

**ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2010 ජුනි මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි —

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ ඉන් නිකුත් කරනු ලබන්නා වූ ඉක්ෂුපාක, තල්, පොල් සහ පදම් කළ අරක්කු සම්මත සැර ලීටරයක් වෙනුවෙන් රුපියල් හයසිය හැටක් (රු. 660.00) වන බද්දක් අය විය යුතු යැයි ද, එසේ වුව ද, ඉහත කී නිෂ්පාදිත අරක්කු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුවද, එකී බද්ද අය නොකළ යුතු යැයි ද ;

(2) 2009 මාර්තු මස 26 වැනි දින අංක 1594/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 908 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

07-299/2

---

**සුරාබදු ආඥාපනත**

අංක 918 දරන සුරාබදු නිවේදනය

**මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2010 ජුනි මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි —

(1) ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන මෙරට සෑදූ, "විදේශීය" ස්ප්‍රීතු සම්මත සැර ලීටරයක් වෙනුවෙන් රුපියල් හත්සිය අනූවක් (රු. 790.00) වන බද්දක් අය විය යුතු යැයි ද, එසේ වුවත් ඉහත කී මෙරට සෑදූ "විදේශීය" ස්ප්‍රීතු දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර හෝ ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද, එකී බද්ද අය නොවිය යුතු යැයි ද ;

(2) 2009 මාර්තු මස 26 වැනි දින අංක 1594/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 909 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

07-299/3

**සුරාබදු ආඥාපනත**

අංක 919 දරන සුරාබදු නිවේදනය

**ධාන්‍ය මත්පැන් සඳහා වූ සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වන අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියෙහි (1) වැනි උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2010 ජුනි මස 24 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි —

(අ) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහකට (5%) වඩා අඩුවන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකට ම රුපියල් පනස් අටක් (රු.58.00) වන බද්දක් පැනවිය යුතු යැයි ද,

(ආ) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති යම් බලයලත් නිෂ්පාදනාගාරයක නිෂ්පාදනය කොට නිකුත් කරනු ලබන ධාන්‍ය මත්පැන් ලේබලයේ සඳහන් නිරපේක්ෂක සැර සියයට පහකට (5%) සහ ඊට වැඩිවන්නේ නම් එසේ නිකුත් කරනු ලබන/ නිෂ්පාදනය කරනු ලබන සෑම ලීටරයකට ම රුපියල් හැත්තෑ හතරක් (රු. 74.00) වන බද්දක් පැනවිය යුතු යැයි ද,

(ඇ) යම් විදේශීය රටක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින යම් තානාපති දූත මණ්ඩලයකට ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනාගාරයෙන් නිකුත් කරන ලද ඒ මත්පැන් වර්ගයෙහි යම් ප්‍රමාණයක් සඳහා කළ යුතු ගෙවීම් ඒ තානාපති දූත මණ්ඩලයේ විදේශීය ගිණුම්වලින් කරනු ලැබේ නම් ඒ මත්පැන් ප්‍රමාණය වෙනුවෙන් ඉහත කී බද්ද අය නොකළ යුතු යැයි ද,

(ඈ) 2008 ඔක්තෝබර් මස 07 වැනි දින අංක 1570/8 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ අංක 906 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද,

නියම කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 23 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

07-299/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.